*සැ. යු.* - 2013.02.22 වැනි දින පළවූ අංක 1,799 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,800 - 2013 මාර්තු මස 01 වැනි සිකුරාදා - 2013.03.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | –– |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 122 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 122 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 122 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 124 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 මාර්තු මස 22 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 මාර්තු මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2013 අංක 52

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම් කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

වෛද්‍ය පී. ජී. මහීපාල මහතා 2012 නොවැම්බර් මස 28 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

03-156/1

2013 අංක 53

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම් කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ එස්. එම්. ජී. එන්. ධර්මසේකර මහතා 2012 දෙසැම්බර් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

03-156/2

# වෙනත් පත්කිරීම් ආදිය

2013 අංක 54

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

යුද්ධ හමුදාධිපති විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක්

පහත නම සඳහන් නිලධාරිණී 2012 දෙසැම්බර් මස 06 වැනි දින සිට කපිතන් නිලයේ නිල ස්ථිර කිරීම යුද්ධ හමුදාධිපති විසින් අනුමත කර ඇත.

තාවකාලික කපිතන් පූර්ණිමා සමන්මලී කුමාරි විතාරණ ශ්‍රීලයුකාබ (නි/5185)

ජේ. ජයසූරිය ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී,
ලුතිතන් ජෙනරල්,
යුද්ධ හමුදාධිපති.

2012 නොවැම්බර් මස 05 වැනි දින,
යුද්ධ හමුදා මූලස්ථානය,
කොළඹ,

03-29

# රජයේ නිවේදන

**1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම් දීම**

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත, 1959 අංක 5 දරන ආඥාපනත, 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත, 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයන් ඉදිරියේ දක්වා ඇති ණයකරු, ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

02. මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාල ණයහිමියන් වෙත ආඥාපනතේ 25(1) 26(1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එන්. ඩබ්. ගුණදාස,
ලේකම්,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2013 ජනවාරි මස 13 වැනි දින,
අංක 80,
අධිකරණ මාවත,
කොළඹ 12.

උපලේඛනය

| ඉල්ලුම්පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමියාගේ නම සහ ලිපිනය |
|---|---|---|
| (01) 41430 | රණසිංහ මුදියන්සේලාගේ නිමල් රණසිංහ මයා, කිරිවනාගාරය, කනත්තේවැව (සියඹලාගහමුලවත්ත) | දියුණුගල්ගේ ඉන්දිකා නිලන්ත විජේරත්න මිය, මැදගම, කනත්තේවැව |
| (02) 41937 | කාරියවසම් පොද්දිවල මාරගේ ලාලනි මිය, "මදාරා" ගෝනපුර, ඉඳුරුපත්විල, පෝද්දල | සජිනි චන්ද්‍රිකා කක්ගොඩ නානයක්කාර මිය, "පතිරණවාස" හපුගල, ගාල්ල |
| (03) 42395 | (1) තෙන්නකෝන් මුදියන්සේලාගේ සෝමා බණ්ඩාර මැණිකේ මිය, තානායම ඉදිරිපිට, ගල්ගමුව | රන් ආදිපතියලාගේ ජයසේන මයා, පොරසන්කුලම, ගල්ගමුව |
| | (2) තෙන්නකෝන් මුදියන්සේලාගේ උක්කුබංඩා මයා, තානායම ඉදිරිපිට, ගල්ගමුව | |
| (04) 42462 | දොඩංගොඩ ලියනගේ ප්‍රභාත් රොෂාන් ජයසිංහ මයා, අංක 57/1, කළුතර පාර, මතුගම | සී/ස ජගත් ඉන්ස්වෙස්මන්ට් පුද්ගලික සමාගම, අංක 486, ඕවිටිගල, මතුගම. |
| (05) 42470 | පිලාන විතාන කංකානම්ගේ කරුණාවතී මිය, ජුල්ගහ වත්ත, උඩහේන, මිරිස්ස | කනක්ක හේවාගේ ලලිත් ප්‍රියන්ත මයා, "වාසනා" පෙම්උයන මාවත, මිරිස්ස |
| (06) 42472 | යහලබැදිගේ ගුණදාස මයා, අලුදෙණිය, හුණුවල, ඕපනායක | වීරකෝන් ආරච්චිලාගේ සේපාලිකා ද සිල්වා මිය, මොරතොට, ඕපනායක |
| (07) 42494 | රණසිංහ කංකානමලාගේ අයිරාංගනී රණසිංහ මිය, අංක 82, කිඹුල්ගොඩ, යක්කල | සම්පත් ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්මන්ට්ස් කම්පැනි ලිමිටඩ්, අංක 60, නුවර පාර, කිරිබත්ගොඩ. |
| (08) 42509 | විජිත් ප්‍රියදීප්ති ජයසූරිය මයා, අංක 114/1/4, 7 වැනි පටුමඟ, මහරගම පාර, මාවිත්තර, පිළියන්දල | සීමාසහිත ජගත් ඉන්වෙස්මන්ට් පුද්ගලික සමාගම, අංක 486, ඕවිටිගල, මතුගම |
| (09) 42564 | වක්වැල්ල මුදියන්සේලාගේ අනුලා රණතුංග මිය, අංක 365/2, මහවත්ත මහරගම | රිල්හේනගේ මල්ලිකා ගුණරත්න මිය, මනාන, මහගම. |
| (10) 42566 | හියාරේ ගමගේ චන්දන කුමාර මයා, අංක 328/1, සිරිනන්ද ජෝතිකාරාම පාර, තලවතුගොඩ | ගල්හේනේගේ ඉනෝජා මුණසිංහ පෙරේරා මිය, අංක 155ජී, පන්නිපිටිය පාර, තලවතුගොඩ |
| (11) 42572 | වර්ණකුලසූරිය මේරියන් ඩයනීටා ශ්‍යාමලී ප්‍රනාන්දු මිය, අංක 01, රෝමන් පාර්ක්, මූදුකොටුව, මාරවිල. | වෙත්තසිංහ ආරච්චිගේ ප්‍රිමල් දූෂාන්ත සම්පත් ප්‍රනාන්දු මයා, රෝමන් පාර්ක්, මූදුකොටුව, මාරවිල |

03-215

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/452012/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමු වැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2013.03.01 වැනි දින සිට 2013.03.15 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම් කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2013.03.22 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

*උපලේඛනය*

| *ලියාපදිංචි කළ පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ දරන කොට්ඨාසයේ 86 වෙළුමේ 103 පත් ඉරුව | ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, මහවෙලගම පිහිටි "යටලකුඹුර" නමැති ඉඩමෙන් බෙදා වෙන්කළ අංක 01 දරන කැබැල්ලට එම්. කේ. සී. ප්‍රේමචන්ද්‍ර බලයලත් මානක තැන විසින් 2002.06.18 වැනි දින මැන සාදන ලද අංක 6367 පිඹුර ප්‍රකාර මායිම්<br><br>*උතුරට* : කයිලගොඩ ඇල පාර,<br>*නැගෙනහිරට* : ලොට් අංක 02<br>*දකුණට* : විජේසේකරගේ ඉඩම<br>*බස්නාහිරට* : ආර්. එම්. පියරත්නගේ ඉඩම<br>ප්‍රමාණය : අ. 00, රූ. 00, පර්. 17.00 | 1. පී. ඉලංගන්තිලක ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහිතක කරන ලද 2002.07.10 දින අංක 9085 දරන තෑගිකරය.<br><br>2. පී. ඉලංගන්තිලක ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහිතක කරන ලද 2002.07.16 දින අංක 9706 දරන අයිතිය අත්හැරීමේ ප්‍රකාශන ඔප්පුව<br><br>3. පී. ඉලංගන්තිලක ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහිතක කරන ලද 2003.10.03 දින අංක 9831 දරන විකුණුම්කරය<br><br>4. එස්. එම්. ද වාස් ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහිතක කරන ලද 2008.09.17 දින අංක 799 දරන විකුණුම්කරය |

03-186

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කොලොන්නාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය

යෝගේන්ද්‍රන් යෝගදේවි.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2012ක් වූ දෙසැම්බර් මස 06 වැනි දින පවත්වන ලද රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනා විශේෂිතව සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ගුණවර්ධන විසින් ලියා සහතික කරන ලද අංක 4332 හා 2012 අප්‍රේල් මස 04 වැනි දින හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත සාදන ලද ණය උකස්කරය මත යෝගේන්ද්‍රම් යෝගදේවි ණයකරු වශයෙන් 2012 සැප්තැම්බර් මස 28 වැනි දින දක්වා වන විට ගෙවිය යුතු රුපියල් මිලියන දාහතහතකුත් හාර ලක්ෂ තුන්දහස් නමසිය තිස් එකයි ශත හැත්තෑහතරක (රු. 17,403,931.74)

මුදල ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී රුපියල් ලක්ෂ දාහතකුත් හාරලක්ෂ තුන්දහස් නමසිය තිස් එකයි ශත හැත්තෑහතරක (රු. 17,403,931.74) මුදල සහ 2012 සැප්තැම්බර් මස 29 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වන කාලයට ඒ මත වැඩිපුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද එතෙක් ගෙවන ලද යම් මුදලක් (වෙතොත්) එම මුදල අඩුකොට එකී මුදල අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයෙහි මැනවින් විස්තර කරනු ලබන දේපළ කොළඹ බලයලත් වෙන්දේසිකාර පී. මුතුකුමාරණ මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරනු ලබන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය බල ප්‍රදේශයේ වැලිසර උප කාර්යල සීමාව තුළ වැලිසර පිහිටි වරිපනම් අංක 046/1 වැල්ලහේන 3 වැනි පටුමග හි පිහිටි කුරුඳුවත්ත නමැති ඉඩම බලයලත් මානක ජී. පී. අබේනායක විසින් මැන සාදන ලද අංක 3350 හා 2003.07.13 වැනි දිනත් දරන පිඹුරේ 21ඒ2 යනුවෙන් නිරූපිත වන එකී 21ඒ2 දරන ඉඩම් කොටස මායිම්, උතුරට : අංක සී/55/76 දරන පිඹුරේ නිරූපිත අංක 21 දරන කැබැල්ලේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : අඩි 20ක් පළල පාර ද (ආර් 5), දකුණට : එකී ඉඩමේම 22 දරන කැබැල්ල සහ බස්නාහිරට : කේ. ඒ. ජී. මැතිව් හිමිකම් පාන ඉඩම ද යන මායිම් තුළ පිහිටි එකී අංක 3350 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහතුනයි දශම දෙකයි පහ (අ. 0, රූ. 0, පර්. 13.25) විශාලත්වය ඇති ඉඩම සහ එහි තුළ තිබෙන ගොඩනැගිලි ඇතුලුව එහි තිබෙන සෑම සියලු දේත් වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 768/28 යටතේ ලියාපදිංචිව ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
ස. සා. (නීති) මංඩලයේ ලේකම්.

03-238/1

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - නුගේගොඩ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය

කදනකන්කානම්ලාගේ මොහාන් ශ්‍රීනාත් පෙරේරා.

2012 ඔක්තෝබර් මස 23 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී හි නමට ලියන ලද්දාවූ ද, 2005.02.11 වැනි දින අංක 1975 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කදනකන්කානම්ලාගේ මොහාන් ශ්‍රීනාත් පෙරේරා ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්රය යටතේ රුපියල් පනස්හතරලක්ෂ එකොලොස්දහස් දෙසිය අසූදෙකයි ශත පනස්දෙක (රු. 5,411,282.52) ක මුදලක් 2012.10.03 වැනි වන විට ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 5,411,282.52ක මුදලක් 2012.10.04 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයක් ද ඇතුළුව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1975 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරනු ලබන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහනගර සභා සීමාවේ උතුරු වැල්ලවත්ත වසමේ අංක 43හි වැල්ලවත්ත පිහිටි දුම්රියපොළ පාරේ වරිපනම් අංක 21-3/1 දරන තට්ටු නිවාස වන බලයලත් මිනින්දෝරු කේ. සෙල්වරත්නම් විසින් මැන සාදන ලද 2004.09.03 දිනැති අංක 10445 දරන සහාධිපත්‍ය පිඹුර බෙදා වෙන්කළ 3 වැනි මහලේ ඒකක TF 3F1 ඉඩමට මායිම්, උතුරට : සීඊ5, 3බී2 සහ සීඊ41හි අතර ඇති විවෘත කොටස බිත්තිය මැදින් ද, නැගෙනහිරට : සීඊ41 සීඊ 23(SW) අතර කොටස සහ සීඊ38 සහ සීඊ4 විවෘතව ඇති කොටස බිත්තිය මැදින් ද, දකුණට : සීඊ4 අතර කොටස සහ විවෘතව ඇති කොටස බිත්තිය මැදින් ද, බස්නාහිරට : සීඊ4 සහ සීඊ5 අතර කොටස සහ විවෘතව ඇති කොටස බිත්තිය මැදින් ද, එස්එෆ්2එෆ්1 මහලේ කොන්ක්‍රීට් බිමේ මැදින් ද හා පතුලින් එෆ්ඕ 4එෆ්1 කොන්ක්‍රීට් බිමේ මැදින් ද, මායිම් වූ 10445 දරන සහාධිපත්‍ය පිඹුර ප්‍රකාර වර්ග මීටර් එකසිය දෙකයි දශම පහයි (ව. මී. 102.5) සහ වර්ග අඩි එක්දහස් එකසිය තුනක (ව. අ. 1,103) විශාලත්වය ඇති බිම් ප්‍රමාණයක් වන මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ පත්ඉරු Con කාර්යාලයේ SP24/47 යටතේ ලියාපදිංචි කර ඇත.

ඒකක ටීඑෆ් 3එෆ් 1 තට්ටු නිවාස ක්‍රමයේ කොටසක් වන අතර එහි නොබෙදු පොදු අගය 204ක් වේ.

ටීඑෆ් 3 එෆ් 1 වන මෙම ස්ථානයට පොදු ප්‍රවේශ වීමේ මාර්ගය සීඊ 41 වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
සහකාර සාමාන්‍යාධිකාරිණි (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

03-238/2

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මොරටුමුල්ල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය

මන්ඩාල වත්තගේ උදය ලාල් කුමාර.

2012 සැප්තැම්බර් මස 27 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනා විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් බී. ඩී. ටී. ධර්මතිලක විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද 2007.07.31 වැනි දින සහ අංක 1874 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මන්ඩාල වත්තගේ උදය ලාල් කුමාර ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හතලිස් පන්ලක්ෂ පනස් පන්දහස් හත්සිය හතලිස් එකයි ශත තිස්හය (රු. 4,555,741.36) ක මුදලක් 2012.08.27 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 4,555,741.36ක මුදලට 2012.08.28 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලිය ද, ප්‍රචාරක වියදම් සඳහා රන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1874 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර වන දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, මැද පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ බැද්දෙගෙදරමුල්ල ගමෙහි පිහිටි "අඹගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ජයසූරිය විසින් මැන සාදන ලද 1997.08.29 වැනි දින සහ අංක 791 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 1 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : පාරෙන් ද, නැගෙනහිරට : ලොට් 2න් ද, දකුණට : හයිලෙවල් පාරෙන් ද සහ බස්නාහිරට : සුනිල් කත්‍රිආරච්චි හිමිකම් කියන ඉඩමෙන් ද මායිම් වූ එකී අංක 791 දරන පිඹුර ප්‍රකාර රූඩ් එකයි පර්චස් දාසයයි දශම අටයි බිංදුව (අ. 0, රූ. 1, පර්. 16.80) ක් විශාල ඉඩම අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 316/85 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
සහකාර සාමාන්‍යාධිකාරී (නීති),
සමාගම් ලේකම්.

03-238/6

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

මොරටුව, රාවතාවත්ත, ගාලු පාරේ අංක 319 හි පිහිටි සිටි ෆාමසි හි වගකීම් වෙනුවෙන් උකස් කරන ලද මොරටුව, රාවතාවත්ත, ගාලු පාරේ අංක 650, 650 1/1, 650 2/1 හි පිහිටි දේපළ

2012.11.06 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් එස්. ආර් ද සිල්වා විසින් සහතික කරන ලද 1996.09.04 දිනැති අංක 1460 දරන උකස් බැඳුම්කරය, මහජන නොතාරිස් ජී. ද අල්විස් විසින් සහතික කරන ලද 1999.06.29 දිනැති අංක 780 දරන උකස් බැඳුම්කරය, මහජන නොතාරිස් ජී. ද අල්විස් විසින් සහතික කරන ලද 2002.12.02 දිනැති අංක 1542 දරන උකස් බැඳුම්කරය, මහජන නොතාරිස් දීප්ති වීරසූරිය විසින් සහතික කරන ලද 2004.08.10 දිනැති අංක 103 දරන උකස් බැඳුම්කරය හා මහජන නොතාරිස් ඊ. කේ. එච්. එම්. කරුණාතිලක විසින් සහතික කරන ලද 2007.05.25 වැනි දිනැති අංක 477 දරන උකස් බැඳුම්කරය අනුව 2012.09.30 දින තෙක් කාලීන ණය මත මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් දෙකෝටි හතලිස් එක් ලක්ෂ අසූතුන් දහස් අටසිය දාහතරයි ශත විසි එකක (රු.2,41,83,814.21) මුදල සමග මුල් මුදල වන රුපියල් එක් කෝටි නව ලක්ෂයක (රු.1,09,00,000) මුදල මත වසරකට සියයට විසිහතරයි දශම පහ (24.5%) බැගින් ගෙවිය යුතු පොලිය 2012.10.01 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් මොරටුව, රාවතාවත්ත ගාලු පාරේ අංක 319 හි පිහිටි සිටි ෆාමසි වෙතින් අයවිය යුතුව ඇත.

2. එකී අංක 1460, 780, 1542, 103 හා 477 යන අංක දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු එකී රුපියල් දෙකෝටි හතලිස් එක් ලක්ෂ අසූ තුන් දහස් අටසිය දාහතරයි ශත විසි එකක (රු.2,41,83,814.21) මුදල සමග 2012.10.01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට මුල් මුදල මත වසරකට සියයට විසිහතරයි දශම පහ (24.5%) බැගින් වූ අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවතේ අංක 50/3 හි ටී. ඇන්ඩ් එච් ඔක්ෂන්ස්හි වෙන්දේසිකාර මහත්වරුන් හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එකී සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥා පනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ අයකර ගැනීම් ඒකකයේ (අයකර ගැනීම් ආයතනික) සම්බන්ධතා කළමනාකරුහට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලයේ, පල්ලෙපත්තුවේ මොරටුව මහ නගර සභා සීමාව තුළ රාවතාවත්තේ කෙලින් වීදියේ පිහිටි වරිපනම් අංක 650, 650 1/1, 650 2/1 දරන මාදංගහ වත්ත සහ පැදිරියගහවත්ත නමැති ඉඩමට එහි ඇති ගහකොළ, ගොඩනැගිලි සහ සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. එල් ද සිල්වා විසින් සාදන ලද 1961 අගෝස්තු 5 වැනි දිනැති අංක 3784 දරන පිඹුරෙහි ලොට් D ලෙස දන්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් D, උතුරට ලොට් E (පාරට වෙන් කළ කොටස) ද, නැගෙනහිරට කොළඹ සිට ගාල්ල දක්වා ප්‍රධාන පාර ද,

දකුණට වේල්ස් කුමර විදුහලේ වත්ත ද, බස්නාහිරට ලොට් Bද මායිම්ව එකී අංක 3784 දරන පිඹුර ප්‍රකාර පර්චස් නවයක (අ. 0, රූ. 0, පර්. 9) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M2372/244 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී. ඒ. ජී. වීරකෝන් බණ්ඩා,
සම්බන්ධතා කළමනාකරු,
(අයකර ගැනීම්- ආයතනික).

2013 ජනවාරි මස 28 වැනි දින,
ලංකා බැංකුව,
අයකර ගැනීමේ ඒකකය,
අංක 04, ලංකා බැංකු මාවත,
කොළඹ 01.

03-152

---

**පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - කඩවත ශාඛාව**

**1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යෝජනා සම්මතය**

ණුදෙනුකරුගේ නම : ඥාණලතා චාන්දනී සමරවීර, ජී. සී. සමරවීර පිරවුම් ස්ථානයේ තනි අයිතිකාරිය

වර්ෂ 2012ක් වූ ජූනි මස 27 වැනි දින පවත්වන ලද පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකමතිකව ද පහත දැක්වෙන පරිද්දෙන් යෝජනා සම්මත කර ගන්නා ලදී.

කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑංක් ලිමිටඩ් යනුවෙන් නම් කරන ලද ලියාපදිංචි අංක පීකිව් 48 දරන පෑන් ඒෂියා බෑංකිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. එන්. රාජකරුණා විසින් සහතික කරන ලද වර්ෂ 2009ක් වූ සැප්තැම්බර් මස 09 වැනි දිනැති අංක 4393 දරන ප්‍රාථමික බැඳුම්කරය මත කළ යුතු වූ ගෙවීම් සිදු කිරීම ජී. සී. සමරවීර පිරවුම් ස්ථානයේ තනි අයිතිකාරිය වන ඥාණලතා චාන්දනී සමරවීර විසින් පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 4393 දරන උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් 2012.04.23 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රු. 11,324,133.64ක මුදල සහ 2012.04.07 වැනි දින දක්වා රු. 11,042,824.31ක මුදල මත වසරකට 18% බැගින් පොළිය ද පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු "බැංකුව " යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතු සහ ලැබිය යුතු හෙයින් ද පහත දැක්වෙන පරිදි යෝජනා සම්මත කර ගනු ලැබේ.

එකී රුපියල් එකොළොස් මිලියන තුන්ලක්ෂ විසි හතරදහස් එකසිය තිස් තුනකුත් ශත හැට හතරක (රු. 11,324,133.64) මුදල ද ඉහත කී පරිදි ඉහත සඳහන් දිනවල සිට වෙන්දේසියේ දින තෙක් පොළිය ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි පිරිවැය සහ මුදල් ද දැනට ලැබී ඇති (කිසිවක් ඇත්නම්) මුදල් අඩුකර, අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ වඩාත් පූර්ණ වශයෙන් විස්තර කර ඇති බැංකුවට උකස්කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලෙස කෝට්ටේ, බැද්දගාන පාරේ, අංක 134 දරන ස්ථානයේ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති ට අධිකාරිය සහ බලය පවරන ලෙස 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තියේ නියමයන් ප්‍රකාරව මෙයින් යෝජනාවක් සම්මත කරගනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (සියනෑ කෝරළේ යනුවෙන් ද කියනු ලබන) අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ගලහිටියාව උප කාර්යාල සීමාව ඇතුළත, ගලහිටියාව ග්‍රාමයේ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු සහ සියලුම දේ සමග වන "කජුගහලන්ද" යනුවෙන් හඳුන්වනු ලබන (බලයලත් මිනින්දෝරු එස්. බී. ජයසේකර විසින් සාදන ලද වර්ෂ 1990ක් වූ අප්‍රේල් මස 10 වැනි දිනැති අංක 1999 දරන පිඹුරේ නැවත බෙදීමක් වන ලොට් බී2 ලෙස නිරූපිත) බලයලත් මිනින්දෝරු එස්. බී. ජයසේකර විසින් සාදන ලද වර්ෂ 2009ක් වූ සැප්තැම්බර් මස 08 වැනි දිනැති අංක 16315 දරන පිඹුරේ ලොට් 'ඒ ' වශයෙන් සලකුණු කර දැක්වෙන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස, එම ලොට් අංක 'ඒ ' කැබැල්ලට මායිම්, උතුරට : එච්. ඒ. සෝමපාලගේ ඉඩම ද, නැගෙනහිරට : මාර්ගය (ආර්. ඩී. ඒ) ද, දකුණට : එච්. ඒ. හේමරත්න ගේ ඉඩම සහ ඉඩම ද සහ බස්නාහිරට : එච්. ඒ. සෝමපාලගේ ඉඩම ද මායිම් වූ එකී අංක 16315 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් දහතුනකුත් දශම හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 13.75) වන ඉඩම වේ.

එකී ලොට් 'ඒ ' කැබැල්ල මෙහි පහත දැක්වෙන ඉඩමෙන් නැවත බෙදා වෙන් කරන ලද්දකි.

බස්නාහිර පළාතේ, ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (සියනෑ කෝරළේ යනුවෙන් ද කියනු ලබන) අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ගලහිටියාව උප කාර්යාල සීමාව ඇතුළත, ගලහිටියාව ග්‍රාමයේ එහි පිහිටි කිරිදිවිට පාරේ වරිපනම් අංක 77 දරන ස්ථානයේ ගොඩනැගිලි, ගහකොළ, පළතුරු සහ සියලුම දේ සමග වන "කජුගහලන්ද" යනුවෙන් හඳුන්වනු ලබන (බලයලත් මිනින්දෝරු එල්. ජී. ප්‍රනාන්දු විසින් සාදන ලද වර්ෂ 1968 ක් වූ සැප්තැම්බර් මස 07 සහ 24 වැනි දිනැති අංක 1175 දරන පිඹුරේ අතුරු බෙදීමක් වන ලොට් 'බී' ලෙස නිරූපිත) බලයලත් මිනින්දෝරු එස්. බී. ජයසේකර විසින් සාදන ලද වර්ෂ 1990ක් වූ අප්‍රේල් මස 10 වැනි දිනැති අංක 1999 දරන පිඹුරේ ලොට් 'බී2' වශයෙන් සලකුණු කර දැක්වෙන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස. එම ලොට් අංක 'බී2' කැබැල්ලට මායිම්, ඊසානට : දැනට එච්. ඒ. සෝමපාලට අයිති අංක 1175 දරන පිඹුරේ ලොට් 'ඒ ' කැබැල්ල ද, ගිණිකොනට : මහා මාර්ගය ද, නිරිතට : දැනට එච්. ඒ. හේමරත්නට අයිති අංක 1175 දරන පිඹුරේ ලොට් 'සී ' කැබැල්ල ද සහ වයඹට : 'බී1' දරන කැබැල්ල ද මායිම් වූ එකී අංක 1999 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් පහළොවකුත් දශම නවයයි හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 15.975) වන ඉඩම වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් බී 370/218 හි සිට බී 579/221 යටතට ගෙන ගොස් ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

උදිතා කොඩිකාර,
සහකාර කළමනාකරු-අයකර ගැනීම්.

03-233

## යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2012 දෙසැම්බර් මස 25 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, ගෝනවල, පට්ටිවල, අංක 99/1 දරන ස්ථානයේ සිල්ක්ලින්ක් ඉන්ටර්නැෂනල් ව්‍යාපාරයේ හවුල්කරුවන් වන (ජාතික හැඳුනුම්පත් අංක 772444281V හිමි) ජාසින් ලියනගේ කපිල මලිත් ජයවර්ධන සහ (ජාතික හැඳුනුම්පත් අංක 805881984V හිමි) අඹගහකෝරලලාගේ මධුරි ධනුෂ්කා අබේසේකර *නොහොත්* ජාසින් ලියනගේ මධුරි ධනුෂ්කා ජයවර්ධන සහ (ජාතික හැඳුනුම්පත් අංක 656201886V හිමි) ජාසින් ලියනගේ මාලනී ජයවර්ධන යන අය මෙහි මින්මතු "බන්ධනදායින් " වශයෙන් සලකා රාජගිරිය, නාවල, කිරිමණ්ඩල මාවතේ, අංක 24 1/A දරන ස්ථානයේ පදිංචි (ජාතික හැඳුනුම්පත් අංක 772444281V හිමි) ජාසින් ලියනගේ කපිල මලිත් ජයවර්ධන (මෙහි මින්මතු ඇතැම් තැනක "උකස්කරු" වශයෙන් හඳුන්වනු ලබන) විසින් වාර ණය පහසුකමක් ලබාගෙන ඇති බැවින් ද, එකී බන්ධනදායින් සහ උකස්කරු, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ඩී. බී. ගමගේ විසින් සහතික කරන ලද අංක 58 සහ 2011.12.12 දින දරන බැඳුම්කරු ලියා අත්සන් කොට එකී වාර ණය පහසුකම නිසා යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින්මතු යූබීසී වශයෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතු රුපියල් එක්කෝටියක (රු. 10,000,000) මුදල සහ ඒ මත පොළිය ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් මෙහ පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ උකස්කොට ඇපයට තබා ඇති බැවින් ද, ඉහත කී වාර ණය පහසුකම නිසා 2011.05.30 වැනි දිනට මුළු හිඟ මුදල වන රුපියල් එක්කෝටි දෙලක්ෂ තිස්එක්දහස් හයසියහැත්තෑහයකුත් ශත පනස්හයක (රු. 10,231,676.56) මුදල සහ 2012.05.31 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඒ මත 29% බැගින් පොළිය ද ඉහත කී බන්ධනදායින්ගෙන් සහ උකස්කරුගෙන් යූබීසී වෙත 2012.05.30 වැනි දිනට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති බැවින් ද,

එකී බන්ධනදායින් විසින් ඉහත කී ණය මුදල හෝ ඉන් කොටසක් ගෙවීම පැහැර හැර ඇති බවට සෑහීමකට පත්වීමෙන් ඉක්බිතිව යූබීසී අධ්‍යක්ෂ මණ්ඩලය, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් එකී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ක්‍රියා කරමින් ඉහත කී වාර ණය පහසුකම මත 2012.05.30 වැනි දිනට මුළු හිඟ මුදල වන රුපියල් එක්කෝටි දෙලක්ෂ තිස්එක්දහස් හයසිය හැත්තෑහයකුත් ශත පනස් හයක (රු. 10,231,676.56ක) මුදල සහ 2012.05.31 වැනි දින සිට ඒ මත 29% බැගින් පොළිය සහ ඉහත කී අංක 58 දරන බැඳුම්කරය සහ 1990 අංක 4 දරන එකී පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාරව යූබීසී වෙත අයකර ගැනීමට හිමිකම් ඇති අනෙකුත් සියලුම මුදල් ප්‍රමාණයන් අයකර ගැනීම සඳහා අංක 58 සහ 2011.12.12 වැනි දින දරන ඉහත බැඳුම්කරය බලය ප්‍රකාරව සහ ඊට යටත්ව යූබීසී වෙත උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ 1990 අංක 04 දරන ඉහත කී පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව විකිණීමට බලයලත් වෙන්දේසිකරු ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් වෙත බලය පැවරීමට 1990 අංක 04 දරන ඉහත කී පනතේ 4 වැනි වගන්තිය යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, පට්ටිවල පිහිටි ගලබොඩවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩබ්. ඩී. එස්. ද සිල්වා මහතා විසින් මැන සාදන ලද අංක 4115 සහ 1998.04.09 දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 5 දරන බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : ශ්‍රී පුන්‍යවර්ධනාරාමය සහ මෙම පිඹුරේ කැබලි අංක 4 ද, නැගෙනහිරට : මෙම පිඹුරේ කැබලි අංක 6 ද, දකුණට : මෙම පිඹුරේ කැබලි අංක 9 ද, බස්නාහිරට : පට්ටිවල පාර සහ ශ්‍රී පුන්‍යවර්ධනාරාමය ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 4115 දරන පිඹුර අනුව පර්චස් දොළහකුත් දශම හයක් (අ. 0, රූ. 0, පර්. 12.6) *නොහොත්* හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි තුනයි එකයි අටයි හතක් (හෙ. 0.03187) විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියළු දේත් සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

එස්. ඩී. එන්. එස්. කන්නන්ගර,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

03-247

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - ගම්පහ ශාඛාව
## (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය

කෝවිලගේ පැට්‍රික් ඇලෝසියස් සිල්වා
සහ
කෝවිලගේ සමන් ප්‍රියන්ත සිල්වා

වර්ෂ 2013ක් වූ ජනවාරි මස 31 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කිව්. ටී. තිසේරා විසින් ලියා සහතික කරන ලද 2002.01.10 සහ 2004.10.13 වැනි දිනයන්හි අංක 2935 සහ අංක 4028 දරන බැඳුම්කර යටතේ සඳහන් නිශ්චල දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.11.21 වැනි දිනට යෝජනා සම්මුතිය ප්‍රකාර බලයලත් වෙන්දේසිකරු ආර්. එස්. මහනාම වෙත පැවරනු ලැබූ බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමට ද, එකී 2935 සහ 4028 දරන බැඳුම්කර යටතේ දේපළ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය ලවා වෙන්දේසියේ විකිණීමට බලය පැවරීමට ද,

එකී 2007ක් වූ නොවැම්බර් මස 21 වැනි දින දරන සම්මුතිය මෙම නව යෝජනා සම්මුතියේ සඳහන් වන තාක් දුරට සංශෝධනය කිරීමටත් ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
සහකාර සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

03-238/5

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - දෙල්ගොඩ ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය

මල්මාල ආරච්චිගේ ප්‍රේමසිරි.

වර්ෂ 2013ක් වූ ජනවාරි මස 31 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව සම්මත කර ගන්නා ලදී.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. එන්. ඩබ්. රාජකරුණා 2007ක් වූ ජූලි මස 20 වැනි දින ලියා සහතික කරන ලද අංක 25133 දරන බැඳුම්කරයේ සඳහන් නිශ්චල දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010ක් වූ මාර්තු මස 01 වැනි දිනට යෝජනා සම්මුතිය ප්‍රකාර බලයලත් වෙන්දේසිකරු එච්. දළුවත්ත වෙත පැවරනු ලැබූ බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමට ද, එකී 25133 දරන බැඳුම්කරය යටතේ දේපළ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ යන අය ලවා වෙන්දේසියේ විකිණීමට බලය පැවරීමට ද,

එකී 2010ක් වූ මාර්තු මස 01 වැනි දින දරන සම්මුතිය මෙම නව යෝජනා සම්මුතියේ සඳහන් වන තාක් දුරට සංශෝධනය කිරීමටත් ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ජී. එල්. ටී. රණවීර,
සහකාර සාමාන්‍යාධිකාරිණි (නීති),
මාණ්ඩලික ලේකම්.

03-238/4

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

එම්. එන්. නසිර් සහ බෙල්කෝ ඒෂියා.
ගිණුම් අංක : 1036 5320 7954 සහ 0089 1000 1088.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013 ක් වූ ජනවාරි මස 24 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව්. 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. පී. ඩබ්ලිව්. ජයවීර යන අය විසින් ලියා සහතික කරන ලද 2009 ජනවාරි මස 26 දාතම හා අංක 4847 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට, ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මොහොමඩ් නෆ්රාස් නසීර් යන අය බන්ධනදායින් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද,

සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. පී. එල්. එච්. එච් සිල්වා යන අය විසින් ලියා සහතික කරන ලද 2010 අගෝස්තු මස 17 දාතම හා අංක 3488 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට, ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ "බෙල්කෝ ඒෂියා" යන ව්‍යවහාරික ව්‍යාපාරක නාමය යටතේ කරගෙන යන ව්‍යාපාරයේ තනි අයිතිකරු වන මොහොමඩ් නෆ්රාස් නසීර් යන අය බන්ධනදායින් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 4847 සහ 3488 දරන බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුලු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් අනූ දෙලක්ෂ හතලිස් හය දහස් හත්සිය හතලිස් හයයි ශත විසි එකක (රු. 9,246,746.21) මුදලක් 2013 ජනවාරි මස 10 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී අනූ දෙලක්ෂ හතලිස් හය දහස් හත්සිය හතලිස් හයයි ශත විසි එකක (රු. 9,246,746.21) මුදල ද 2013 ජනවාරි මස 11 දින සිට අංක 4847 සහ 3488 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තුන්ලක්ෂ විසි නම දහස් හයසියයක (රු. 3,29,600) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහක් (12%), රුපියල් විසි දෙලක්ෂ දහඅට දහස් තුන්සිය අසූවයි ශත අසූ පහක (රු. 2,218,380.85) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) හා තවත් රුපියල් හැටලක්ෂ විසි හය දහස් එකසිය එකොළහයි ශත විස්සක (රු. 6,026,111.20) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසිතුනක් (23%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 4847 සහ 3488 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාවන් තුළ අත්තිඩිය පිහිටි අත්තිඩිය පාර වරිපනම් අංක 191/1 දරන ගලබොඩවත්ත යැයි කියනු ලබන ඉඩමට (බලයලත් මානක තැන ඩබ්ලිව්. අභංගම යන අය විසින් සාදන ලද 1987 නොවැම්බර් මස 04 දාතම හා අංක 3990 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 උප බෙදුමක් සහ නැවත මිනුමක් වන) බලයලත් මානක තැන ජේ. එම්. ඩබ්ලිව් සමරනායක යන අය විසින් සාදන ලද (2004 මැයි 07 වැනි දින සත්‍ය පිටපතක් ලෙස සහතික කරන ලද) 2003 මාර්තු මස 29 දාතම හා අංක 1843 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් '2A ' වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අඩි 10 පළල පාර (අංක 3990 දරන පිඹුරේ ලොට් 4), නැගෙනහිරට : ලොට් 2B, දකුණට : ජී. කරෝලිස් පෙරේරා යන අයගේ දේපළ සහ බස්නාහිරට : අංක 3990 දරන පිඹුරේ ලොට් 9 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 7.5) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධනයන් ද සමග එකී අංක 1843 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව M3341/101 යටතේ දෙල්කන්ද/නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන ඩබ්ලිව්. අහංගම යන අය විසින් සාදන ලද 1987 නොවැම්බර් මස 12 දාතම හා අංක 3990 දරන පිඹුරේ නිරූපිත ලොට් 4 වශයෙන් ලකුණු කොට ඇති මාර්ගය (අඩි 10ක් පළල පාර සඳහා වෙන්කිරීම) දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

03-240/1

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

ඇන්තන් ට්‍රේඩින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0009 1000 5669.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013 ක් වූ ජනවාරි මස 24 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව්. 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ජී. කේ. විජේතුංග යන අය විසින් ලියා සහතික කරන ලද 2011 ජනවාරි මස 26 දාතම හා අංක 4629 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් නීතිත් යටතේ නිසිලෙස සංස්ථාගත කොට ඇති සමාගමක් වන ඇන්තන් ට්‍රේඩින් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායින් වශයෙන් හා රෙන්ස්ලි පෝල් ඇන්තනිමුතු වින්ස්ලි පෝල් ඇන්තනිමුතු සහ ඇන්ස්ලි පෝල් ඇන්තනිමුතු යන අය උකස්කරුවන් වශයෙන් ද පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 4629 දරන බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුලු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ මුදලින් රුපියල් පන්කෝටි තිස්එක් ලක්ෂ පනස්තුන් දහස් තුන්සිය පනස් පහයි ශත පනස් හතරක (රු. 53,153,355.54) මුදලක් 2012 නොවැම්බර් මස 07 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් පන්කෝටි තිස් එක්ලක්ෂ පනස්තුන් දහස් තුන්සිය පනස් පහයි හත පනස් හතරක (රු. 53,153,355.54) මුදල ද 2012 නොවැම්බර් මස 08 දින සිට අංක 4629 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හාර කෝටි අනූනව ලක්ෂ අනූනව දහස් නවසිය හතලිස් දෙකයි ශත හැට තුනක (රු. 49,999,942.63) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතක් (17%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 4629 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහ නගර සභා සීමාවත් තුළ දකුණු කොච්චිකඩේ වෝඩ් අංක 19 පිහිටි පරණ යෝන් වීදිය වරිපනම් අංක 193 (කොටසක්) දරන බලයලත් මානක තැන එස්. එච්. බී. ජෝශප් යන අය විසින් සාදන ලද 1984 දෙසැම්බර් මස 11 දාතම හා අංක 62/84 දරන පිඹුරේ නිරූපිත ඉඩම් කොටසක් උප බෙදුමක් සහ නැවත මිනුමක් වන ඉඩමට බලයලත් මානක තැන සින්නතම්බි යන අය විසින් සාදන ලද 1994 නොවැම්බර් මස 07 දාතම හා අංක 4746 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් X වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අලුත් යෝන් වීදිය වරිපනම් අංක 216 දරන පරිශ්‍රයන්. නැගෙනහිරට : මෙහි ලොට් Y, දකුණට : පරණ යොන් වීදිය සහ බස්නාහිරට : පරණ යොන් වීදිය වරිපනම් අංක 189 දරන පරිශ්‍රයන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් නවයයි දශම පහයි හයක් (අ. 0, රූ. පර්. 9.56) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශාතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන් ද සමග එකී අංක 4746 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව A1116/228 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

03-240/2

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**
14. ගැසට් පත්‍රය නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතුය.

### * ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිළ රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිළදී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2013** | | | |
| මාර්තු | 2013.03.01 | සිකුරාදා | 2013.02.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.03.08 | සිකුරාදා | 2013.02.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.03.15 | සිකුරාදා | 2013.03.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.03.22 | සිකුරාදා | 2013.03.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.03.28 | බ්‍රහස්පතින්දා | 2013.03.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| අප්‍රේල් | 2013.04.05 | සිකුරාදා | 2013.03.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.04.12 | සිකුරාදා | 2013.03.28 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2013.04.19 | සිකුරාදා | 2013.04.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.04.26 | සිකුරාදා | 2013.04.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| මැයි | 2013.05.03 | සිකුරාදා | 2013.04.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.05.10 | සිකුරාදා | 2013.04.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.05.17 | සිකුරාදා | 2013.05.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.05.23 | බ්‍රහස්පතින්දා | 2013.05.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.05.31 | සිකුරාදා | 2013.05.17 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.